# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි තෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2022/2023

## CMS 3142 - ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න　　　　　　　　කාලය පැය දෙකයි

---

01. ගුවන්විදුලි මාධ්‍ය සඳහා වැඩසටහන් නිෂ්පාදනයේ දී ගුවන්විදුලි මාධ්‍යයට ආවේණික සංකල්පීය සංරචක වැදගත් වන ආකාරය යෝග්‍ය නිදර්ශන ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 20)*

02. ශ්‍රව්‍ය ශාලිකාවක් (Audio Studio) ඉදිකිරීමේ දී වෙසෙසින් සාවධාන විය යුතු තාක්ෂණික අංග හඳුන්වා දී ප්‍රායෝගික භාවිතයේ දී ඒවායෙහි උපයෝගීතාව විග්‍රහ කොට දක්වන්න.

*(ලකුණු 20)*

03. 'ප්‍රවෘත්ති' යන සංකල්පය විවරණය කොට ගුවන්විදුලි ප්‍රවෘත්ති මාධ්‍යවේදියාගේ භූමිකාව කාර්යබද්ධ පර්යාලෝකයකින් විශ්ලේෂණය කරන්න.

*(ලකුණු 20)*

*(අනෙක් පිටුවට)*

04. ගුවන්විදුලි මාධ්‍ය ක්ෂේත්‍රයට විශේෂිත කාලීන ප්‍රවණතා හමුවේ ගුවන්විදුලි මාධ්‍යවේදියා මුහුණපාන අභියෝග හා ඒවා ඉක්මවිය හැකි ක්‍රමෝපාය නිදර්ශන සහිත ව විස්තර කරන්න.

*(ලකුණු 20)*

05. අරමුණු කරන ලද ග්‍රාහකයා සමග මනා සම්බන්ධයක් ගොඩනංවා ගැනීමටත්, ස්වකීය ප්‍රතිරූපය අභිවර්ධනය කරගැනීමටත් සමකාලීන ගුවන්විදුලි නාලිකා විසින් උපයෝගී කොට ගැනෙන මහජන සම්බන්ධතා විධික්‍රම නිදර්ශන සහිත ව විග්‍රහ කරන්න.

*(ලකුණු 20)*

06. ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනයේ දී වෙසෙසින් සැලකිය යුතු ආචාරධර්ම කවරේදැයි ඔබට අභිමත වැඩසටහන් ප්‍රවර්ග ඇසුරින් පෙන්වා දෙන්න.

*(ලකුණු 20)*